# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2026.09.09 **මාධ්‍ය නිවේදන අංක : 2026/096**

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>නියමිත දිනට වත්කම් සහ බැරකම් ප්‍රකාශ (වාර්ෂික හෝ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශ) ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් පරිපාලන දඩ මුදල් අය කර ගැනීමට පෙර හේතු දැක්වීමට අවස්ථාව ලබා දීම- 2026</u>**

2026.06.30 වන දිනෙන් පසුව එනම් නියමිත දිනය පසුවී (2026.08.31 දින දක්වා) ඉදිරිපත් කරන ලද වත්කම් සහ බැරකම් ප්‍රකාශ (වාර්ෂික හෝ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශ) සම්බන්ධයෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 90 වගන්තිය ප්‍රකාරව ප්‍රමාද වූ දින ගණනට අදාළව පරිපාලන දඩ මුදලක් අය කිරීම නීත්‍යානුකූලව සිදු කළ යුතුව ඇත.

කෙසේ වුවද, එසේ පරිපාලන දඩ අය කර ගැනීමට පෙර එම ප්‍රමාදය සම්බන්ධයෙන් යම් සාධාරණ හේතුවක් තිබේනම් එම සාධාරණ හේතුව කොමිෂන් සභාව වෙත දැන්වීමේ අවස්ථාව ලබා දීමට කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 80(1) වගන්තිය ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු එහෙත් අදාළ වත්කම් සහ බැරකම් ප්‍රකාශ නියමිත දිනට ප්‍රමාද වී ඉදිරිපත් කළ තැනැත්තකු වේ නම් එම ප්‍රමාදය සම්බන්ධයෙන් පරිපාලන දඩ මුදලක් අය නොකිරීමට හේතු 2026 සැප්තැම්බර් මස 30 දින හෝ ඊට පෙර ලිඛිතව (තහවුරු කිරීමේ ලේඛන තිබේ නම් ඒ සමඟ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය.

එසේ යොමු කිරීමේදී, ප්‍රකාශය කළ තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකය එම හේතු දැක්වීමේදී සඳහන් කර තිබීම අනිවාර්ය වන අතර 2026 සැප්තැම්බර් මස 30 දින වනතුරුත් කොමිෂන් සභාව වෙත හේතු දැක්වීමක් නොලැබුනේ නම්, ප්‍රමාදය පිළිබඳව දැක්වීමට හේතුවක් නොමැති බව සලකා පරිපාලන දඩ අය කර ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

- ❖ හේතු දැක්වීම ඉදිරිපත් කළ යුතු විෂය :
  - තැපැලෙන් නම් : "ප්‍රමාද වීමට හේතු දැක්වීම"ලෙස ලිපි කවරයේ වම්පස ඉහල කෙළවර සඳහන් කරන්න.
  - විද්‍යුත් තැපැලෙන් නම්: "ප්‍රමාද වීමට හේතු දැක්වීම"ලෙස Subject හි සඳහන් කරන්න.
- ❖ ආයතනික ලිපිනය : අධ්‍යක්ෂ (වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය), නො.36, මලලසේකර මාවත, කොළඹ 07.
- ❖ විද්‍යුත් ලිපිනය : ald@ciaboc.gov.lk
- ❖ දුරකථන/ ෆැක්ස් අංකය : 0112587287
- ❖ වට්ස්ඇප් අංකය : 0767011954

**ආර්.එස්.ඒ. දිසානායක**
අධ්‍යක්ෂ ජනරාල්

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk

09th September 2026 Media Release No : 2026/096

Editor-in-Chief / News Director
All Media Institutions

**Notice to show cause prior to the imposition of an administrative penalty for late submission of the Declaration of Assets and Liabilities (Annual or Post-retirement declaration) – 2026**

Where a Declaration of Assets and Liabilities (Annual or Post-Retirement Declaration) has been submitted after the prescribed due date of 30.06.2026 and on or before 31.08.2026, the administrative penalty prescribed under Section 90 of the Anti-Corruption Act, No. 9 of 2023, shall be imposed, as applicable, having regard to the number of days by which the submission was delayed.

However, the Commission has decided to provide an opportunity to the person concerned to submit written reasons, supported by relevant documentary evidence, if any, as to why an administrative penalty should not be imposed in respect of the delay in submitting the Declaration of Assets and Liabilities.

Accordingly, in terms of Section 80(1) of the Anti-Corruption Act, No. 9 of 2023, any person who is required to submit a Declaration of Assets and Liabilities and who has submitted such Declaration after the prescribed due date is hereby provided an opportunity to show cause as to why an administrative penalty should not be imposed in respect of such delay. The person concerned is required to submit, in writing, the reasons for the delay and any supporting documentary evidence, if available, to the Commission to Investigate Allegation of Bribery or Corruption on or before 30 September 2026.

The written submission shall mandatorily include the National Identity Card (NIC) number and telephone number of the person making the submission. Failure to submit the reasons for the delay, together with any supporting documentary evidence, on or before 30th September 2026 will be considered as a failure to show reasonable cause for the delay. In such event, the administrative penalty applicable in respect of the delay shall be imposed in accordance with the applicable provisions of the Anti-Corruption Act, No. 9 of 2023.

- ❖ Subject under which the statement of reasons should be submitted:
- If submitted by post : "Reasons for the delay" should be indicated on the top left-hand corner of the envelope
- If submitted by email : "Reasons for the delay" should be indicated as the Subject of the email.
- ❖ Official Address :Director (Assets and Liabilities Declaration Division),
  Commission to Investigate Allegations of Bribery or Corruption,
  No. 36, Malalasekara Mawatha, Colombo 07.
- ❖ Email Address : ald@ciaboc.gov.lk
- ❖ Telephone/Fax No.: 0112587287
- ❖ WhatsApp No. : 0767011954

**R.S.A. Dissanayake**
Director General